ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1995/6 - 2016 නොවැම්බර් මස 28 වැනි සඳුදා - 2016.11.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය - දෝ/ඉ/1/අත්/අධි/108.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය - 4/3/6/2012/HW/229.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, දොඩන්ගොඩ ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ, සපුගහවත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද අංක ක4527 හා 2016.10.25 දිනැති මූලික පිඹුරේ පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0194ක් පමණ වූ පහත විස්තර සඳහන් කෙරෙන ඉඩම් කැබලි දෙක (02);

01. **කැබලි අංක 01 - ඉඩමේ නම: කැටකැරුල්ලගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සපුගහවත්ත දොඩන්ගොඩ පදිංචි යූ.කේ.ඩී. ජිනසේන; ප්‍රමාණය: හෙක්. 0.0033.**

උතුරට: යූ.කේ.ඩී. ජිනසේන සහ මහේෂ් ද සිල්වා හිමිකම් කියන කැටකැරුල්ලගහවත්ත සහ කැබලි අංක 02; නැගෙනහිරට: කැබලි අංක 02; දකුණට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); බටහිරට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ මූ.පි.ක. 3557 හි කැබලි අංක 55.

02. **කැබලි අංක 02 - ඉඩමේ නම: කැටකැරුල්ලගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සපුගහවත්ත දොඩන්ගොඩ පදිංචි මහේෂ් ද සිල්වා; ප්‍රමාණය: හෙක්. 0.0161.**

උතුරට: මහේෂ් ද සිල්වා හිමිකම් කියන කැටකැරුල්ලගහවත්ත; නැගෙනහිරට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); දකුණට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ කැබලි අංක 01; බටහිරට: කැබලි අංක 01 සහ යූ.කේ.ඩී. ජිනසේන හිමිකම් කියන කැටකැරුල්ලගහවත්ත.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම්කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2016 දෙසැම්බර් මස 21 වැනි දින පෙ.ව. 10.00ට දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2016 දෙසැම්බර් මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ආර්.එම්. දර්ශනා රණසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
දොඩන්ගොඩ,

2016 නොවැම්බර් මස 22 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 553

1A - G 24655 - 22 (2016/11)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.